සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

| 7 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **1 - 5 දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු පහත පද්‍ය ඇසුරෙන් සපයන්න.**

A කිරි බොනකොට පුංචි යාළු - උගුර උගුර අපට දේලු
බංඩි ගෙඩිය පිරෙනවා - අපි සෙල්ලම් කරනවා.

B අද වෙස්සන්තර රාජ පුතා
මන්ද්‍රි කුමාරි බඳී .......

C සෙල්ලම් කරමින් දබර නොවන්නේ
නොතරම් වදනින් බැණ නොමගන්නේ

D අහසින් අවුත් මිණි අක් නයිදු යැදුමට
රහතන් මැදෙහි මුණි හිඳ මිණි පළඟ පිට

E නමස් සවන්ත හද්‍රාය
සර්ව ගෝචර චක්ෂුෂෙ ....

01 සිරිත් මල්දමෙහි ඇතුළත් ගීතය අඩංගු අක්ෂරය වන්නේ,

(i) B ය. (ii) C ය. (iii) D ය. (iv) E ය.

02 පාලිත ලොකුපෝතාගම මහතා රචිත නාට්‍යයකට අයත් ගීතයක් වන්නේ,

(i) A ය. (ii) B ය. (iii) C ය. (iv) D ය.

03 ඓතිහාසික සිදුවීමක් පදනම් කරගත් පද්‍ය ඇතුළත් අක්ෂරය වන්නේ,

(i) A ය. (ii) C ය. (iii) D ය. (iv) E ය.

04 B අක්ෂරයෙන් කියවෙන්නේ,

(i) නූතන නාට්‍යයකි. (ii) සොකරි නාට්‍යයෙනි.
(iii) කෝලම් නාට්‍යයෙනි. (iv) නූර්ති නාට්‍යයෙනි.

05 නම් පොතට අයත් පද්‍යයකි.

(i) A ය. (ii) B ය. (iii) D ය. (iv) E ය.

- **6 - 10 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

06 පන්ති කාමර නාට්‍ය තුළ දැකිය නොහැකි ලක්ෂණයකි.

(i) අනුකරණය (ii) සමාරෝපය

(iii) ආත්මාර්ථකාමීබව (iv) සංවාද භාවිතය

07 රංග භූමියක් යනු,

(i) චිත්‍රපටි ප්‍රදර්ශනය කරන ස්ථානයකි. (ii) නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයකි.

(iii) සුවිශේෂ පහසුකම් සහිත ස්ථානයකි. (iv) දෙමහල් ගොඩනැගිල්ලක් සහිත ස්ථානයකි.

08 ස්වභාවික පරිසරයේ සිදුවන සංසිද්ධියකි.

(i) පොල් රුප්පාවට සඳ එළිය වැටීම. (ii) රිය අනතුරක් සිදු වීම.

(iii) කඳුවැටි අතුරින් හිරු පායා ඒම. (iv) නැගෙන රළ සහිත මුහුදු වෙරළක්.

09 වෙද පුටුව නම් රංග අභ්‍යාසය අයත් වන්නේ,

(i) පරිකල්පන අභ්‍යාස සඳහා ය. (ii) ශිථිලීකරණ අභ්‍යාස සඳහා ය.

(iii) කටහඬ අභ්‍යාස සඳහා ය. (iv) ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස සඳහා ය.

10 නාට්‍යයක වේෂ භූෂණ අයත් වන අභිනය වන්නේ,

(i) ආංගික අභිනය (ii) වාචික අභිනය

(iii) සාත්වික අභිනය (iv) ආහාර්ය අභිනය

- **11 - 15 දක්වා ප්‍රශ්න වලට හරි නම් හරි (✓) ලකුණද, වැරදි නම් වැරදි (✗) ලකුණ ද යොදන්න.**

11 වැලි මිරිකා දිය ගෙන හැර දැක්වූයේ රාජසිංහ රජතුමාය. ( )

12 ක්ෂණික නිරූපණය සඳහා නාට්‍ය පිටපතක් තිබිය හැක. ( )

13 සිය අත්දැකීම් පාදක කරගත් අවස්ථා නිරූපණයේ දී වඩාත් ප්‍රබල හා අපූර්ව අවස්ථා නාට්‍යෝචිතව ඉදිරිපත් කළ යුතුය. ( )

14 පෙළ නිර්මාණය සඳහා කතන්දරයක් තෝරා ගැනීමේදී නාට්‍යමය ගුණයෙන් අනූන අවස්ථා පමණක් තෝරා ගත යුතුය. ( )

15 වේෂ භූෂණ යනු රංග වස්ත්‍ර හා රංගාභරණයන්ය. ( )

- **16 - 20 දක්වා ප්‍රශ්නවල ඇති හිස්තැන් වරහන් තුළ දී ඇති වචන යොදා සම්පූර්ණ කරන්න.**

**( තේමාව / දෙවැනි මහින්ද / ශිථිලීකරණය / රාජ රත්නාකරය / රංග විධාන / සිරි පැරකුම් / සිරිත් මල්දම)**

16 නාට්‍ය පිටපතක ........................................ ඇතුළත් වේ.

17 නාට්‍යයකින් කියවෙන මූලික අදහස ........................................ නම් වේ.

18 ඓතිහාසික කතා ඇතුළත් ග්‍රන්ථයක් ලෙස ........................................ හැඳින්විය හැක.

19 ශරීරය සැහැල්ලු කිරීම ........................................ යනුවෙන් හඳුන්වයි.

20 ........................................ ඉතිහාස කතා පදනම් කරගත් වේදිකා නාට්‍යයකි.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරු සපයන්න. (මුළු ප්‍රශ්න ගණන 03 කි)**

01 ''ඉතිහාස කතා නාට්‍යයට'' යන තේමාව යටතේ පංති කාමරයේ දී ගුරුතුමා / ගුරුතුමිය සමඟ ඔබ සාකච්ඡාවක නිරත වන්නට ඇත. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ''අහසින් වැටෙන එක ජල බිඳක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට යා නොදෙව්'' යන ප්‍රකාශය කළ රජතුමාගේ නම ලියන්න.

(ii) සතුන්ට කරුණාව දක්වා වෛද්‍ය ප්‍රතිකාර කළ රජතුමා කවුද?

(iii) ආගමික සේවය වෙනුවෙන් නිදහස උදෙසා කටයුතු කළ ස්වාමීන් වහන්සේ කෙනෙකු නම් කරන්න.

(iv) ඉතිහාස කතා පදනම් කරගත් වේදිකා නාට්‍ය 02 ක් ලියන්න.

(v) ඔබ උගත් වීර කතා ඇසුරින් ඔබ සිත්ගත් එක් චරිතයක් නම් කර ඊට හේතුවක් ලියන්න.

(2 × 5 = 10)

02 (i) රංග අභ්‍යාස යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද? (ල. 02)

(ii) රංග අභ්‍යාස වර්ග 03 ක් නම් කරන්න. (ල. 03)

(iii) රංග අභ්‍යාස වල නිරත වීමෙන් නළුවාට ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න. (ල. 05)

03 (i) වේෂ භූෂණ යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ල. 02)

(ii) වේෂ භූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් ලියන්න. (ල. 03)

(iii) ''තැල්ල'' ඇඳ නිර්මාණය කරගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. (ල. 05)

04 (i) රංග භූමියක් යනු කුමක්ද? (ල. 02)

(ii) රංග භූමියක ලක්ෂණ 03 ක් ලියන්න. (ල. 03)

(iii) ඔබ කැමති රංග භූමියක් ඇඳ දක්වන්න. (ල. 05)

05

සුරුට්ටු බීමට පිරිය නොවන්නේ
දුම්කොළ හැපුමට පුරුදු නොවන්නේ
බුලත් විකීමට සතුටු නොවන්නේ
මේ ගති හැදුමට නොහොබි සිතන්නේ

මෙම කවිය ඇසුරු කර ගනිමින් නාට්‍ය පිටපතක් රචනා කරන්න.

( මෙහිදී රංග විධාන, ගැටුම් අවස්ථා, නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.) (ල. 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | ii | 02 | i | 03 | iii | 04 | iv | 05 | iv | 06 | iii | 07 | ii | 08 | ii |
| 09 | i | 10 | iv | 11 | × | 12 | × | 13 | ✓ | 14 | ✓ | 15 | ✓ | 16 | රංග විධාන |

17 තේමාව   18 රාජ රත්නාකරය   19 ශිථිලිකරණය   20 දෙවැනි මහින්ද (ලකුණු 20)

## II කොටස

01 (i) පරාක්‍රමබාහු රජතුමා (ල. 02)

(ii) බුද්ධදාස රජතුමා (ල. 02)

(iii) වාරියපොල සුමංගල හිමි, කුඩාපොළ හාමුදුරුවෝ (ල. 02)

(iv) දෝන කතිරිනා, දෙවන මහින්ද, සුබ සහ යස, ගජමන් පුවත (ල. 02)

(v) නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 02)

(ලකුණු 10)

02 (i) නාට්‍යයක නළුවාගේ කායික හා මානසික සමබරතාවය ඇති කර ගැනීම සඳහා කරනු ලබන අභ්‍යාස (ල. 02)

(ii) ශිථිලිකරණ අභ්‍යාස, තාපන අභ්‍යාස, ශ්වසන අභ්‍යාස, කටහඬ අභ්‍යාස, දර්පණ අභ්‍යාස, ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස (ල. 03)

(iii) ක්ෂණිකව තීරණ ගැනීම, රංගන කාර්ය පහසු වේ, සබකෝලය දුරු වේ. පරිකල්පන ශක්තිය දියුණු වීම, නිර්මාණශීලී චින්තනය, මානසික ඒකාග්‍රතාව, අනුකරණය හැකියාව වර්ධනය වීම. (ල. 05)

(ලකුණු 10)

03 (i) නාට්‍යයක නළුවන් අඳින පළඳින දේවල් (ල. 02)

(ii) රංග කාර්යයට බාධාවක් නොවීම, නාට්‍යයට උචිත බව, චරිතය හඳුනාගැනීමට හැකි වීම, කාලයට, දේශයට යුගයට ගැලපීම. (ල. 03)

(iii) පංති කාමරයේදී නිර්මාණය කළ ආකාරය නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

(ලකුණු 10)

04 (i) නාට්‍යයක් රඟ දක්වන ඕනෑම ස්ථානයක් (ල. 02)

(ii) සමතලා බව, අවම පහසුකම් වලින් සමන්විත වීම, රංගනයට බාධාවක් නොවීම ආදී නිවැරදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 03)

(iii) නිවැරදි පිළිතුරුවලට ලකුණු ලබා දෙන්න. (ල. 05)

(ලකුණු 10)

05 ගැටුම්, රංගවිධාන, නාට්‍යෝචිත සිදුවීම ආදිය පිළිබඳ සලකා බලා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

7 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

01. අමර ගියා දිව්‍ය ලෝකේ නාට්‍යයේ එක් චරිතයක් රඟපාන්න. (ලකුණු 10)

02. නාට්‍ය ගීතයක් ගායනා කරන්න. (ලකුණු 10)

03. ජන කතාවක් නාට්‍යානුසාරීව ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

04. පහත සඳහන් වචන අර්ථ 3 ක් වන සේ උච්චාරණය කරන්න.

    (i) අනේ අම්මේ

    (ii) ඔයා කවුද?

    (iii) මෙහාට එන්න

    (iv) අඬන්න එපා (ලකුණු 10)

05. කණ්ඩායම් නාට්‍යයක් රඟ දක්වන්න. (ලකුණු 10)